IHRA
UNIVERSITY OF COLOMBO

# මානව සම්පත් අභිවර්ධන ආයතනය

## කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - II කොටස - 2016/2017

(දෙවන සෙමෙස්තරය)

(පවත්වන ලද්දේ 2019 ජුනි)

## BLE 206 - ශ්‍රී ලංකාවේ ශ්‍රම භාවිතයේ ඓතිහාසික පැතිමාන

**අයදුම්කරුවන්ට උපදෙස් :**

(1) ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින් (08) සහ පිටු එකකින් (01) සමන්විත වේ.

(2) ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

(3) කාලය පැය තුනයි. (03)

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

01. ශ්‍රී ලංකාවේ ජනාවාස බිහිවීම සහ වර්ධනය කෙරෙහි බලපෑ සාධක පැහැදිලි කර රජරට ශිෂ්ටාචාරය බිඳවැටීම කෙරෙහි බලපෑ සාධක සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

02. ආගම සමාජ සංස්ථාවක් ලෙස සමාජානුයෝජන ක්‍රියාවලියේදී දක්වන දායකත්වය වර්තමාන සන්දර්භය තුළ කෙබඳුදැයි සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

03. 'වර්තමානයේදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය සමාජ ස්ථරායන ක්‍රමයක් ලෙස ක්‍රියාත්මක වේ'. මෙම ප්‍රකාශය විවේචනාත්මකව විග්‍රහ කරන්න.

(ලකුණු 20)

04. සංස්කෘතික විසරණය යනු කුමක්දැයි පැහැදිලි කර සංස්කෘතික විසරණයෙහි ඇති වාසි අවාසි පැහැදිලි කරන්න.

(ලකුණු 20)

05. බ්‍රිතාන්‍යය පාලනය යටතේ වර්ධනය වූ වතු වැවිලි ආර්ථිකය ශ්‍රී ලංකාවේ කුල ක්‍රමය කෙරෙහි කෙසේ බලපෑම් කර ඇත්දැයි සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

06. පෘතුගීසි සහ ලන්දේසි පාලනය නිසා ඇති වූ සමාජ සහ සංස්කෘතික බලපෑම සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

07. පවුල, විවාහය සහ ඥාතීන් යන සංකල්ප කෙටියෙන් පැහැදිලි කර විවාහය මගින් ඉටුවන කාර්යභාරය සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

08. පහත දැක්වෙන ඕනෑම මාතෘකා දෙකක් (02) පිළිබඳ සටහන් ලියන්න.

I. රාජකාරී ක්‍රමය
II. තත්ත්වය සහ කාර්යභාරය
III. උත්සව හා චාරිත්‍ර වාරිත්‍ර
IV. සමාජ ව්‍යුහය
V. කාන්තා ශ්‍රම දායකත්වය

(එක් කොටසකට උපරිම ලකුණු 10 කි.)

(10x2=20)

****************************